## කොළඹ විශ්වවිද්‍යාලය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය - රාජගිරිය
## 05 වන බී. ඒ. එම්. එස්. අතිරේක පරීක්ෂණය - 2016 ජූලි

## ස්ත්‍රී රෝග

සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කාලය - පැය 03
පෙ. ව. 9.00 – මධ්‍යාහ්න 12. 00

01 i ස්ත්‍රී වයස් විවරණය දක්වන්න. (ලකුණු 08)

ii අර්තවාභාවය ආසන්න වයසේ පසුවන කාන්තාවකට ඇතිවිය හැකි සෞඛ්‍ය ගැටළු සාකච්ඡා කර ඒ සඳහා සුදුසු උපදෙස් හා ප්‍රතිකාර ලියන්න. (ලකුණු 12)

02 i වේදනාත්මක ඔසප්වීමක් ඇති කරන රෝග අවස්ථා නම් කරන්න. (ලකුණු 04)

ii ඉහත රෝග ලක්ෂණය ඇති අවුරුදු 18 ක අවිවාහක තරුණියක් ඔසප් වේදනාව පළමු දින 02 න් පසු සමනය වන බව පවසයි. මේ තත්ත්වය සඳහා විවිධ රෝග විනිර්ණය දක්වා ස්ථිර විනිශ්චයට එළඹෙන්න. (ලකුණු 08)

iii මෙම අවස්ථාවට සුදුසු ප්‍රතිකාර පද්ධතිය පැහැදිලි කරන්න. (ලකුණු 08)

03 i වන්ධ්‍යාභාවය පිළිබඳ වූ භාරත වර්ගීකරණය දක්වන්න. (ලකුණු 02)

ii වයස අවුරුදු 31 ක විවාහක කාන්තාවකට විවාහ වී මාස 8 ක් ගතවූව ද දරුවෙක් පිළිසිඳ නොගැනීම නිසා කරනු ලැබූ Scan පරීක්ෂණයේ දී ඇගේ බීජ මේරීමේ ගැටළුවක් ද, ඩිම්බ කෝෂ ගත ග්‍රන්ථි තත්ත්වයක් ද හඳුනා ගෙන ඇත.

(අ) ඇයට චිකිත්සා කිරීමේදී ඔබ විසින් සලකා බලන කරුණු මොනවාද ? (ලකුණු 06)

(ආ) ඒ සඳහා ඔබ නිර්දේශ කරන කෂාය 4 ක් වට්ටෝරු කර සම්පාදිත ඖෂධ 4 ක් හා ස්ථානික ප්‍රතිකාර පථ්‍යාපථ්‍ය සමග දක්වන්න. (ලකුණු 12)

04 i චරක, සුශ්‍රැත, වාග්භට යන ආචාර්යවරුන්ට අනුව යෝනි ව්‍යාපත් වර්ගීකරණය දක්වන්න. (ලකුණු 04)

ii වයස අවුරුදු 58 ක විවාහක තිඳරු මවකට යෝනි මගින් සුදු පැහැ ස්‍රාවයක් පිටවන බවත්, කිවිසුම් යන විටදී සුළු වශයෙන් මූත්‍රා පිටවන බවත් පැමිණිලි කරයි.

(අ) විවිධ රෝග විනිර්ණය දක්වා ඇයගේ මෙම තත්ත්වය පිළිබඳ රෝග නිර්ණයට එළඹෙන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ආ) ඇය සඳහා ඔබ නිර්දේශ කරනු ලබන ස්ථානික ප්‍රතිකාර මොනවාද ?
ඒ සඳහා කෂාය 2 ක් වට්ටෝරු කරන්න.
සම්පාදිත ඖෂධ 2 ක් ද පථ්‍යාපථ්‍ය සමගින් දක්වන්න. (ලකුණු 10)

05 කෙටි සටහන් ලියන්න.

i යෝනි කන්ද
ii චූචුක විදාරණ
iii ආයුර්වේද මතානුකූලව ආර්තව චක්‍රයේ අවස්ථා
iv උපදංශ

(ලකුණු 5 X 4 = 20)

2016. 07. 21